# ලංසු සඳහා ආරාධනයයි

## කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

### ධාන්‍ය රනිල කුලයට අයත් බෝග සහ තෙල් බෝග වගාව (Oil Crops) තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති (Sprinkler Blade Type Irrigation Systems) සැපයීම, බෙදා හැරීම සහ ස්ථාපනය කිරීම. (අදියර - 2)

### ලංසු අංකය: SARP/G/NCB/OC/2026/800

1. ශ්‍රී ලංකාව වෙත ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අරමුදලෙන් (IFAD) ණය මුදලක් ලබාගෙන ඇති අතර, එම ණය ලැබීම්වලින් කොටසක් SARP ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් යටතේ කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා ධාන්‍ය රනිල කුලයට අයත් බෝග සහ තෙල් බෝග වගාවට සහාය වීම සඳහා බ්ලේඩ් වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති සැපයීම, බෙදා හැරීම සහ ස්ථාපනය කිරීම සඳහා යෙදවීමට අදහස් කරයි.

2. SARP ව්‍යාපෘතිය, තෙල් බෝග වගාව සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති සැපයීම, බෙදා හැරීම සහ ස්ථාපනය කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසු කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. කාණ්ඩ අංකය , අයිතම නාමය, අවශ්‍ය ප්‍රමාණයක් සහ අනුරූප ලංසු සුරක්ෂණයේ වටිනාකම ආදී තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

| කාණ්ඩ අංකය | අයිතම විස්තරය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රුපියල්) |
|---|---|---|---|
| A | කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති (Blade Type Sprinkler Irrigation Systems) | 800 | 2,400,000.00 |
| B | පුත්තලම දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති | 300 | 900,000.00 |
| C | අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති ( 1 කණ්ඩායම) | 850 | 2,550,000.00 |
| D | අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති ( 2 කණ්ඩායම) | 850 | 2,550,000.00 |
| E | වව්නියාව දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති | 400 | 1,200,000.00 |
| F | මන්නාරම දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති | 300 | 900,000.00 |

3. ඉහත සඳහන් කළ පරිදි, කැබලි අක්ෂර අනුව, ලංසු කරුවන්ට එක් කාණ්ඩයකට හෝ කිහිපයකට හෝ සියලු ම කාණ්ඩ අංක සඳහා ලංසු ඉදිරිපත් කළ හැකියාව ඇත. ලංසු ඇගයීමට ලක් කරනු ලබන්නේ කාණ්ඩ අංක පදනම මත ය. කෙසේ වෙතත්, තනි ලංසු කරුවෙකුට ප්‍රදානය කළ හැකි උපරිම ප්‍රමාණය පද්ධති 850 කට සීමා වේ. එය ගැනුම්කරු ට වඩාත් වාසිදායක වන ලෙස එක් හෝ වැඩි කාණ්ඩ අක්ෂර හරහා පද්ධති 850 ක ප්‍රමාණයකට ඇගයීමෙන් පසු සැලකිය යුතු ලෙස ප්‍රතිචාර දක්වන අවම මිල ඉදිරිපත් කර ඇති ලංසු කරු වෙත පිරිනැමේ. ඇගයීමේ ක්‍රියාවලිය හරහා ස්ථාපිත කර ඇති ශ්‍රේණිගත කිරීම අනුව, ඉතිරි ඕනෑම කාණ්ඩ අක්ෂර හෝ ප්‍රමාණයක් ඊළඟ සැලකිය යුතු ලෙස ප්‍රතිචාර දක්වන අවම මිල ඉදිරිපත් කර ඇති ලංසු කරුට ප්‍රදානය කෙරේ.

4. ප්‍රතිචාර දැක්වීමට සහ ලංසු ලේඛනයේ දක්වා ඇති සීමාවන්ට අනුගත වීමට කැමති සියළුම යෝග්‍ය හා පූර්ණ ලංසු කරුවන් සඳහා මෙම ලංසු ආරාධනාව විවෘත වේ. තවද මේ පිළිබඳ ව උනන්දුවක් දක්වන ලංසු කරුවන්ට වැඩිදුර තොරතුරු SARP ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක. කාර්යාල වේලාව තුළ දී, පහත දැක්වෙන ලිපිනයැති ස්ථානයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේ දී ගාස්තු ගෙවීමකින් තොර ව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

5. ජාතික තරගකාරී ලංසු කරණ පටිපාටිය (NCB) යටතේ **ලංසු** මෙහෙයවන/කැඳවන අතර [www.ifad.org/project-procurement](www.ifad.org/project-procurement) වෙබ් අඩවියෙහි ලබා දී ඇති IFAD ප්‍රසම්පාදන අත්පොතට අනුකූලව මෙම ලංසු ලිපිලේඛනයන්හි ඇගයීමේ පටිපාටිය විස්තර කොට ඇත. NCB ක්‍රියාවලියෙහි විස්තර කොට ඇති පරිදි කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර නිර්දේශයන් පරීක්ෂා කර බැලීම, සුදුසුකම් හා පෙර කාර්යසාධන සමාලෝචනය සහ සත්‍යාපනය කිරීම ඇතුළත් වේ.

6. ලංසු ලේඛනයේ iii පරිච්ඡේදය, ලංසු දත්ත පත්‍රිකාවේ (BDS) විස්තර කර ඇති පරිදි, 2026.07.31 දින පස්වරු 2.00 ට SARP PMU කාර්යාලයේ දී ලංසු තැබීමට පෙර පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙන බව කාරුණිකව දන්වමි.

7. ලංසු ඉදිරිපත් කිරීමට කැමති ලංසු කරුවන් රු. 25,000/= ක ආපසු නො ගෙවන ගාස්තුවක් ගෙවා ලංසු ලේඛනය මිල දී ගත යුතු ය.

8. පහත දැක්වෙන ලිපිනයට, ලංසු කරුගේ සම්පූර්ණ තොරතුරු සහිත ව විද්‍යුත් ලිපියක් හෝ ලිපියක් එවීමෙන් ද ලංසු ලිපි ලේඛන ලබා ගත හැක. ලංසු ලේඛන ලබා ගැනීම සඳහා මුදල් ගෙවීම, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP) අයත් වන **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7040662,** වෙත කෙරෙන බැංකු ගනුදෙනුවක් මගින් සිදු කළ හැකි **අතර SARP ව්‍යාපෘතිය වෙත පැමිණීමෙන් ද එහි ගණකාධිකරී අංශය වෙත මුදල් ගෙවිය හැකියාව ඇත.**

9. ලංසු දත්ත පත්‍රිකාවෙහි , ලංසු කරුවන්ට උපදෙස් 23.1 හි නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ එහි සඳහන් කර ඇති ලිපිනයට 2026 අගෝස්තු මස 11 දින පෙ.ව. 11.00 ට පෙර ලංසු ගෙනවිත් භාර දිය යුතු අතර එදින පෙ.ව.11.15 ට ලංසු විවෘත කරනු ලැබේ. ඉලෙක්ට්‍රොනික ලංසු පිළිනොගන්නා බව කරුණාවෙන් සැලකිය යුතු ය.

10. කිසිදු තත්වයක් යටතේ ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා බවත්, එවැනි ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු හරවා එවන බවත්, ඒවායෙහි පිරිවැය ලංසු කරු විසින්ම දැරිය යුතු බවත් සියළුම ලංසු කරුවන් දැනගත යුතුය. තවද සියළුම ලංසු සමග ඉහත වගුවේ දක්වා ඇති පරිදි ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතු ය.

11. ලිපිනය


**ව්‍යාපෘති අධ්‍යක්ෂ**

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

**නොම්මර 2/2/1, කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.**

**දුරකථන: 011 2770998 විද්‍යුත් තැපැල: procurementsarp@gmail.com**